# දුලාගේ සිහිනය



දුල්නෙත් සෙතික ජයසූරිය

# දුලාගේ සිහිනය


## දුල්නෙත් සෙතික ජයසූරිය


කතා

පළමු දිගහැරුම - දුලා

දෙවන දිගහැරුම - දුලා ගිය ගමන


## මහනුවර කිංස්වුඩ් විද්‍යාලය

## 9 -B



2026.05.10

ISBN : 978-624-211-252-7

# තිළිණය

මගේ සිහින සැබෑවක් කර ගන්නට...

මට දිරි දෙන...

මඟ කියා දෙන...

ආදරණීය

අම්මාට.. තාත්තාට..

ගුරුවරුන්ට...

ආදරයෙන් පුදමි...



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොතේ ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි. මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය

# හැඳින්වීම

විවිධ දේ පිළිබඳ සොයා බැලීමට
නිරන්තරයෙන් උනන්දු වන මම...සීගිරි
ඉතිහාසය පිළිබද ඇති රසවත් තොරතුරු
ඇතැම් අවස්ථාවල විශ්වාස කිරීමට පවා
නොහැකි තොරතුරු පිළිබඳ ඉතා
ආශාවෙන් ගවේෂණය කරන්නෙමි.ඒ
ඔස්සේ යමින් "දූලාගේ සිහිනය" නිර්මානය
වී ඇත.



**දුල්නෙත් සෙතික ජයසූරිය**

# ස්තූතිය

මෙම පොත නිර්මාණය කිරීමේදී...

මා හට

උපදෙස් ලබා දුන්..

සහය ලබා දුන්..

දයාබර අම්මා තාත්තා ඇතුළු ඔබ සැමට..

ස්තුතියි....


**දුල්නෙත් සෙතික ජයසූරිය**

මම හරිම කැමතියි පරණ කතා අහන්න...අපේ සීයා තමයි මට ඔය ඉතිහාස කතා කියලා දෙන්නේ...ඉතිං ඔක්කොටම කලින් කියන්නම්කෝ...මගේ නම "දූලා".....






ඔන්න අර මම කලින් කිව්වා වගේ.. අපේ සීයා කියන්නේ මට ඉතිහාස කතා කියලා දෙන ඉතිහාසඥයෙක් වගේ කෙනෙක්...අපේ සීය මට කියලා දීපු පුදුම හිතෙන ලස්සන ඉතිහාස කතා වලින් නිර්මාණය වුණ චිත්‍රපටිත් මම බලලා තියෙනවා...කොහොම හරි ඉතිං සීයා කියලා දුන්න ඒ කතා මට හොඳට මතක තියෙනවා..



මම දැන් පුරාවිද්‍යාඥයෙක්...මම ලංකාවෙ තියෙන විවිධ තැන්වල ගිහිල්ලා කැණීම් කරනවා..විස්තර හොයනවා..දැන් මම කැණීම් කරන්නේ සීගිරියේ...මම තාම කැණීම් කරන්න පටන් ගත්තෙ සීගිරියේ එක පැත්තක් විතරයි...එක පැත්තක් කියල කිව්වට මේක ලොකුම ලොකු භූමියක්...ඒ ගමේ ඉන්න සීයලා ආච්චිලා වගේම,ඉස්සර සීගිරි කැනීම් කරපු පුරාවිද්‍යාඥයෙනුත් අපිට කිව්වේ "ඔය පැත්ත නම් කැණීම් කරලා ඉවර කරන්න අවුරුදු සීයක් වත් යයි"... කියලා.ඒ කතාව නම් හරි... අපි තාමත් කැණීම් කරන ගමන්....




සීගිරිය කැණීම් කරන අපේ කණ්ඩායමේ පස් දෙනෙක් හිටියා.අපි පස්දෙනාම සීගිරිය පස් පැත්තකට ගිහිල්ල තමයි කැනීම් කරේ.මට දිගින් දිගටම කැණීම් කරන්න හම්බවුනේ සීගිරියේ ගල ගාව ම ප්‍රදේශයක්.ඒ ප්‍රදේශය මම තෝරගන්න ලොකු හේතුවකුත් තිබුණා.



ඔන්න ඉතින් මේකයි කතාව මම සීගිරිය ගල ගාවම කැණීම් කර කර ඉද්දී මම දැක්කා විශේෂ තැනක්.ඒ තැන ගලේම දොරක හැඩයකට කටාරම් කොටලා තිබ්බා.මම උපරිම උත්සාහයක් දැරුවේ දොර අරින්න හැබැයි බැරි වුණා.ටික කාලයක් ගත වුණා....



දවසක් මං ආයෙත් සීගිරි කැණීම් වලට යද්දී මට පාර වැරදුණා.ඒ පාර දිගේ යද්දි මම දැක්ක පුංචි දිලිසෙන වස්තුවක්..ඒ වගේම මම දැක්කා ඊට ඉස්සරහින් පුංචි අඩි පාරකුත් තියෙනවා.දිලිසෙන වස්තුවත් අතට අරගෙන ම මම අඩි පාර දිගේ හෙමින් හෙමින් ගියා.




හරිම පුදුමයි. මට දකින්න ලැබුණේ මගේ අතේ තිබෙන වස්තුවට සමාන පුංචි සිදුරක්...මම ඒ සිදුරට මගේ අතේ තිබුණු පුංචි වස්තුව දැම්මා.එතකොටම විශාල ශබ්දයකුත් එක්ක එතන දොර විවෘත වුණා.ඒ දොරෙන් ඇතුළෙ තිබුණ දේ ගැන ඔයාලා නම් විශ්වාස කරන එකකුත් නැහැ.එතන තිබුණේ සීගිරියේ හදවත...



මම දන්නවා... ඔයාලට වගේම තමයි මේ කතාව ලියන මටත් ඒක අදහගන්න බැරි වුණා.මම පුදුම වුණා.එතන මම දැක්කා පුංචි පොතක්..හරියට පුස්කොළ පොතක් වගේ..හැබැයි මේ පොත හදලා තිබුණෙ දිලිසෙන රත්තරන් වලින්..මම ඒ පොත අරගෙන මම ඉන්න තැනට ගියා...




ඒ පොතේ තිබුණේ හරි පුදුම දේවල්..අදහාගන්න බැරි දේවල්...පියාඹන පීරිසි ..පිටසක්වල ජීවීන්ගේ රූප..විවිධ සංඥා...ඒ පොතේ තිබුණා.ඒ රූප අතර ගලට ඔබ්බෙන් Star Gate එකක් තියෙන පින්තූරයක් තිබුණා.ඒ කියන්නේ වෙනත් ලෝකවලට ගමන් කරන්න පුළුවන් දොරටුවක් වගේ දෙයක්.ඒ ගල "සිහගිරිය" නමින් නම් කරලා තිබුණා.මට පුදුම හිතුනා .






මම තාමත් ඒ ගැන හොයන ගමන්..හරියටම විස්තර හොයාගත්ත දවසක මං ඒ කතාවත් ඔයාලට කියන්නම්.දැනට මම හොයාගත්තේ ඔය ටික විතරයි...ඔයාලත් මේ ගැන දැන්ම කාටවත්ම කියන්න එපා හොඳේ.







"පුතා හොඳට ම පරක්කු වෙලා.. නැගිටින්න..නැගිටින්න.."මම එකපාරටම ඇහැරුණා...මං මේ දැකලා තියෙන්නේ හීනයක්.....ඇත්තටම සීගිරිය කියන්නේ ...අපේ සීයා ඒ දවස්වල මට කියලා දුන්න වගේම ..හරි පුදුම හිතෙන රහස් ගොඩක් හැංගිච්ච තැනක් කියලා මට හැම වෙලාවකම හිතෙනවා...දවසක මමත් පුරාවිද්‍යාඥයෙක් වෙලා..සීගිරිය ගැන අලුත් දේවල් හොයාගන්නවා....පරම්පරාවෙන් පරම්පරාවට අපේ ඉතිහාසය අපි අරගෙන යන්න ඕනේ...එතන අපේ අනාගතය හදාගන්න අපිට ඉගෙන ගන්න දේවල් ගොඩක් තියෙනවා..



# පසුවදන

අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් “හේමමාලා උපහාර” ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහමායා බාළිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, මහනුවර ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සත්කාරිය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්<br>(ව්‍යාපෘති නිර්මාතෘ)